සියලු ම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

නව නිර්දේශය / New Syllabus

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

# General Certificate of Education (Adv. Level) Examination – 2025

දෙවන වාර පරීක්ෂණය - Second Term Test

බෞද්ධ ශිෂ්ටාචාරය II
Buddhist Civilization

| 45 | S | II |
|---|---|---|

13 ශ්‍රේණිය
Grade 13

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

උපදෙස්:

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී පුමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I කොටස

01.

1) බමුණු වර්ණය ට අයත් ආපද් ධර්ම **හතරක්** නම් කරන්න. (ල.02)
2) ශ්‍රමණ ගුරුකුල **තුනක්** සැකෙවින් දක්වන්න. (ල.03)
3) බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජකරණය ට ලක්ව පැවැති බවට සාධක **හතරක්** දක්වන්න. (ල.04)
4) අජිත කේසකම්බලි තුමාගේ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ල.05)
5) යාගය නිරර්ථක ආගමික පිළිවෙතක් බවට සාධක දක්වන්න. (ල.06)

02.

1) අෂ්ට විද්‍යාවන්ගෙන් **හතරක්** නිවැරදිව නම් කරන්න. (ල.02)
2) **"සත්ථා දේවමනුස්සානං"** බුදු ගුණය හඳුන්වන්න. (ල.03)
3) බුද්ධ චරිතයෙන් ප්‍රකට වන ආදර්ශවත් නායකත්ව ලක්ෂණ **හතරක්** හඳුන්වා දෙන්න. (ල.04)
4) අනාථ පිණ්ඩික සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **පහක්** දක්වන්න. (ල.05)
5) අල්පේච්ඡතා ජීවිතයෙන් ප්‍රකට වන **"සුභරතාවෙහි"** කාලීන වැදගත්කම පෙන්වා දෙන්න. (ල.06)

03.

1) **"කායේන සංවරෝ සාධු..."** යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ල.02)
2) ඉහත 03 (1) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියා දක්වන්න. (ල.03)
3) සිඟාලෝවාද සූත්‍රය ට අනුව ගිහි පැවිදි යුතුකම් නම් කරන්න. (ල.04)
4) බෞද්ධ සදිසා නමස්කාරය නූතන සමාජයට ද වඩාත් ගැළපෙන බව පෙන්වා දෙන්න. (ල.05)
5) පුද්ගලයාගේ මෙලොව ලෞකික දියුණුවට හේතුවන මංගල කරුණු **හයක්** ගෙනහැර දක්වන්න. (ල.06)

සියලු ම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

# II කොටස

04.

1) නූතන පාරිසරික ගැටලු අවම කර ගැනීමට පරිසර සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අදාළ කරගත හැකිදැයි පරීක්ෂා කරන්න. (ල.10)
2) හොඳ - නරක විනිශ්චය කිරීමෙහිලා භාවිත බෞද්ධ නිර්ණායකවල කාලීන වැදගත්කම පෙන්වා දෙන්න. (ල.10)

05.

1) **"ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සටහන් කළ සංගායනාවක් ලෙස දෙවන ධර්ම සංගායනාව සැළකෙයි."** විමසන්න. (ල.10)
2) ධර්මාශෝක අධිරාජයා බුදු සසුනේ දියුණුවට සිදුකරන ලද මෙහෙය උදාහරණ මගින් සනාථ කරන්න. (ල.10)

06.

1) බුදු දහම මුල්බැස ගැනීමත් සමඟ ම මෙරට රාජ්‍ය පාලනය කෙරෙහි බෞද්ධ ආභාසය ලැබුණු බවට සාධක ගෙනහැර දක්වන්න. (ල.10)
2) මියන්මාරයට බුදු දහම ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් එරට සංස්කෘතිය බුදුසමයෙන් පෝෂණය වූ බවට සාධක ගෙනහැර දක්වන්න. (ල.10)

07.

1) ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති දේශීය ඇදහිලි හා විශ්වාස සැකෙවින් දක්වා, බුදු දහම ලැබීමත් සමඟ ඒවා නව අර්ථ ගැන්වුණු ආකාරය පිළිබඳව පෙන්වා දෙන්න. (ල.10)
2) දඹදෙණි යුගයේ සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය කෙබඳුදැයි සනිදර්ශනව පැහැදිලි කරන්න. (ල.10)

08.

1) ස්තූප ආකෘති හඳුන්වා, ස්තූපයේ අංග මගින් ඉදිරිපත් කෙරෙන සංකේතාර්ථ පිළිබඳව පවත්නා මත පිළිබඳ විමසීමක් කරන්න. (ල.10)
2) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පමණක් තෝරාගෙන, ඒ පිළිබඳව ප්‍රමාණවත් වූ විස්තරයක් සපයන්න. (ල.5×2 = 10)
    1. දස කුසල්
    2. මහනුවර යුගයේ චිත්‍ර කලාව
    3. පටිමාසරය
    4. දසරාජ ධර්ම